සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

නම : ............................................... ඉතිහාසය කාලය : පැය 02 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

---

## I කොටස

(01) ගොවියන් වී වගාවට අවශ්‍ය ජලය රඳවා තබා ගැනීමටත් ක්‍රමානුකූලව ජලය පිටතට ගැනීමටත් සුදුසු වන සේ සකස් කළ අංගය .................................. ලෙස හඳුන්වනු ලැබේ.

(ලියැදි, නියර, වක්කඩ)

(02) තම පියාවන දෙවන කස්සප රජු මිය ගිය පසු මානවම්ම කුමරු ආරක්ෂාව පතා පැනගියේ .................................. රාජ්‍යටයි.

(පාණ්ඩව, පල්ලව, චෝළ)

(03) අතුරුදහන්ව පැවැති ශිෂ්ටාචාරයක් ලෙස පැරණි නගර නිර්මාණ ශිල්පයට සාක්ෂි සපයන මොහොන්දාරෝ නගරය පිහිටා ඇත්තේ .................................. යේ ය.

(චීනයේ ය, මැලේසියාවේ ය, පාකිස්ථානයේ)

(04) II වන පරාක්‍රමබාහු රජු රටේ සංවර්ධන කටයුතු සිදු කිරීමට .................................. නම් ඇමතිවරයා පත් කළේ ය.

(දේව පතිරාජ, ලංකාපුර, අලකේශ්වර)

(05) පෙරික්ලීස් නම් පාලකයාගේ කාලය .................................. රාජ්‍යයේ ස්වර්ණමය යුගයක් විය.

(ස්පාටා, ඇතැන්ස්, කොරින්ත්)

- අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරි නම් '3' ලකුණ ද වැරදි නම් 'X' ලකුණ ද වරහන තුළ යොදන්න.

(06) අතීත ගොවියා වර්ෂා කාලය එළඹෙන විට බොහෝ විට හේන්වල වගා කළේ කටුසර බෝගය ( )

(07) පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීමට කුට්ඨක සෙනවියාගේ උදවු ගත්තේ I සේන රජු ය. ( )

(08) ලෝක සංස්කෘතික උරුමවලට කිසිදු හානියක් හෝ විනාශයක් කිරීමට ඉඩ නොතබා ආරක්ෂා කිරීම යුනෙස්කෝ සංවිධානයේ කාර්ය භාරය වේ. ( )

(09) චන්ද්‍රභානු නම් ජාවක රජුගේ ආක්‍රමණය දෙවරක් මැඩ පැවැත්වූයේ I වන පැරකුම් රජු ය. ( )

(10) රෝමයේ මුලින් පැවැතියේ ගෝත්‍ර හෝ පවුල් පදනම් කර ගත් පාලන ක්‍රමයකි. ( )

I අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) අතීත විදේශ වෙළඳාමේ දී වැදගත් වූ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි වරාය තෝරන්න.

1. මාතොට
2. සල්වතොට
3. ගොඩවාය
4. ගෝකණ්ණ

(12) දසගම් පාලනයට හා අපරාධ නඩු විසඳීම සම්බන්ධ නීති රැසක් අඩංගු වන ශිලාලේඛනය කුමක් දැයි තෝරන්න.

1. මිහින්තලා පුවරු ලිපිය
2. වේවැල්කැටිය ශිලා ලිපිය
3. සොරබොර වැව ටැම් ලිපිය
4. තෝනිගල සෙල් ලිපිය

(13) පෞරාණික ඉදිකිරීම් නිසා ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කළ ගාලුකොටුවේ ඇති ගෘහ නිර්මාණ හා ඉදිකිරීම් කුමන ජාතියට අයත් ඒවා ද?

1. බ්‍රිතාන්‍යය
2. ලන්දේසි
3. ප්‍රංශ
4. පෘතුගීසි

(14) ඉබන් බතූතා නම් අරාබි ජාතික සංචාරකයා ලංකාවට පැමිණියේ කුමන යුගයේ ද?

1. යාපහුව
2. කුරුණෑගල
3. ගම්පොළ
4. කෝට්ටේ

(15) ග්‍රීක වීර කාව්‍යයක් ලෙස ප්‍රචලිත ඉලියඩ් හා ඔඩිසි කාව්‍යයේ රචකයා කවු ද?

1. ප්ලේටෝ
2. හෝමර්
3. ආකිමිඩීස්
4. හිපොක්‍රටීස්

I අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර කුමක් දැයි ලියා දක්වන්න.

(16) අතීතයේ රන් කර්මාන්තයේ යෙදෙන කණ්ඩායම් .......................................... නමින් හඳුන්වා ඇත.

(17) I වන විජයබාහු රජතුමාගේ චරිතයේ දැක්වෙන උසස් ගුණාංග විස්තර කර ඇත්තේ .......................................... සෙල්ලිපියේ ය.

(18) දකුණු පළාතේ ඇති අම්බලන්ගොඩ හා උඩුපිල යන ප්‍රදේශ ප්‍රසිද්ධියට පත් වී ඇත්තේ .......................................... කර්මාන්ත සම්බන්ධයෙන් ය.

(19) පාලියෙන් ලියා තිබූ පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කළේ ....................................... යුගයේ දී ය.

(20) රෝමය ගොඩනැගුවේ .......................................... නම් තැනැත්තෙක් යැයි ජනප්‍රවාදයේ සඳහන් වෙයි.

(ලකුණු 20 x 2 = 40)

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- වෙනත් කොළයක පිළිතුරු ලියන්න.




(01) (i) අතීත ජන සමාජයේ වෙළඳාම දියුණු වීමත් සමග බිහි වූ වෙළඳ නගරයක් A අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද? (ලකුණු 2)

(ii) කාලිංග මාඝ දකුණට ඒම වැළැක්වීමට සංඛනම් සෙනවියෙකු විසින් පිහිටුවා ගත් බලකොටුව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 2)




(iii) සිතියමේ දැක්වෙන්නේ ඉතාලි අර්ධද්වීපයයි. එය නැගෙනහිරින් වෙන් වන මුහුද A අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද? (ලකුණු 2)

(iv) සිතියමේ රෝමය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද? (ලකුණු 2)



(v) පින්තූරයේ දැක්වෙන පිරිවෙන කුමක් ද? (ලකුණු 2)

(vi) එය ඉදිකළේ කුමන යුගයේ දී ද? (ලකුණු 2)



(vii) මෙම පින්තූරයේ දැක්වෙන ප්‍රතිමාව කුමක් ද? (ලකුණු 2)

(viii) එය නිර්මාණය කිරීමට ගන්නා ලද ද්‍රව්‍ය 02ක් නම් කරන්න. (ලකුණු 2)

(ලකුණු 2 X 8 = 16)

(02) (i) අතීත හේන් ගොවියා හේන රැක ගැනීමට යෙදූ උපක්‍රම 03ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත සඳහන් වන්නේ අතීත ජන සමාජයේ පැවැති ආර්ථික කටයුතු හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශවලට සම්බන්ධ ආර්ථික කටයුතු ඉදිරියෙන් ලියන්න.

A - දැව දඬු පුලුස්සා බිම සැකසීම.
B - මී ගවයන් බැඳ නගුල් යොදා ගෙන පස බුරුල් කිරීම.
C - භාණ්ඩ ප්‍රවාහනයට තවලම යොදා ගැනීම.
D - සුරනිමල යෝධයා සුවඳ විළවුන් ගැනීමට මාගම සිට අනුරපුරයට පැමිණීම. (ලකුණු 4)

(iii) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ අපේ රටට බුදුදහම හඳුන්වා දීම නිසා අතීත ජන සමාජය යහපත් ගුණාංග රාශියකින් පෝෂණය විය. වර්තමානයට ආදර්ශ ගත හැකි එදා පැවැති යහපත් ගුණාංග 04ක් ලියන්න. (ලකුණු 4)

(03) (i) පහත සඳහන් රජවරුන් අතරින් මානවම්ම පෙළපතට අයත් කීර්තිමත් රජවරු තිදෙනෙක් නම් කරන්න.

(වසභ රජු, මානවම්ම රජු, ධාතුසේන රජතුමා, පළමු වන සේන රජු, I වන පැරකුම් රජු, II වන සේන රජු)

(ලකුණු 3)

(ii) අනුරපුර රාජධානි යුගයේ මධ්‍ය පාලනයේ දී රජුට සහය දැක්වූ නිලධාරීන් දෙදෙනෙකු හා ප්‍රාදේශීය පාලනයේ දී සහය වූ නිලධාරීන් දෙදෙනෙකු පහත දක්වා ඇත. ඔවුන්ට හිමි කාර්යයන් ඉදිරියෙන් ලියා දක්වන්න.

A - යුව රජු B - මහලේඛක

C - රට ලද්දන් D - ගමික (ලකුණු 4)

(iii) අනුරාධපුරයේ රජවරු සමාජ සුබසාධනය සඳහා ඉටු කළ ක්‍රියාකාරකම් සමූහයක් පහත දැක්වේ. ඒ හා සම්බන්ධ රජවරුන්ගේ නම් ඉදිරියෙන් ලියන්න.

A - සෑම ගම් 10කට ම වෛද්‍යවරයෙකු පත් කර වෙදහල් ඉදිකිරීම.

B - අන්ධයන් හා රෝගීන් සඳහා ආරෝග්‍යශාලා ඉදි කිරීම.

C - පොළොන්නරුවේ හා පදවියේ ආරෝග්‍යශාලා ඉදි කරවා ඒවා නඩත්තුවට ගම් බිම් පිහිටු වීම.

D - වසංගත රෝගීන්ගේ සාත්තුව පිණිස රෝහල් ඉදිකරවා අනුරාධපුර නගරයේ වෙදහල් පිහිටුවීම.

(ලකුණු 4)

(04) (i) පහත සඳහන් වන්නේ ලංකාවට බලපෑම් කළ දකුණු ඉන්දීය රාජ්‍ය 03ක අගනුවරවල් ය. එම අගනුවරවලට අදාළ දකුණු ඉන්දීය රාජ්‍ය 03 නම් කරන්න.

A - කාංචිපුරය B - මදුරාපුරය

C - තන්ජෝරය (ලකුණු 3)

(ii) පහත දැක්වෙන්නේ ක්‍රි. ව. 1070 දී චෝල බලයෙන් රට මුදවා ගැනීමට විජයබාහු රජතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ගයන් ය. එම ක්‍රියාමාර්ගවල අනුපිළිවෙළ සකස් කර අක්ෂරය අනුපිලිවෙළින් ලියන්න.

A. සියලු ශක්තිය යොදා චෝලයන් පරාජය කොට පොළොන්නරුව අගනුවර කරගැනීම.

B. ඉන්දියාවෙන් එන චෝළ හමුදාවලට පහරදීමට මහාතිත්ථ වරායට හමුදා යැවීම.

C. චෝළ රාජ්‍යයෙන් එවන ලද හමුදාව සමඟ සටන් කොට පරාජය වී වාකිරිගලට පසු බැසීම.

D. මහානාගහුල දී අවසන් සටනට සූදානම් වීම.

E. I වන විජයබාහු රජු චෝළයන් සමඟ සටන්කර පළමු සටනින් ජයගෙන පොළොන්නරුව අල්ලා ගැනීම.

F. චෝළ ආක්‍රමණයෙන් බේරීමට මළය දේශයට යාම.

G. විදේශ ආධාර ලබා ගැනීමට බුරුමය සමඟ සබඳතා ගොඩනැඟීම.

H. කේශ ධාතු කාශ්‍යප පරාජය කොට රුහුණේ පාලකයා වීම. (ලකුණු 8)


(05) (i) පහත සඳහන් වන්නේ පසු කාලීන පාලන මධ්‍යස්ථානවල පාලන කටයුතු කළ රජවරුන් ඉටු කරන ලද සේවාවන් කිහිපයකි. ඒවා කරන ලද රජවරුන් කවුරුන් දැයි ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 3)

A. දළදා වහන්සේ කෑගල්ලේ බෙලිගල දළදා මැඳුරක් කරවා එහි තැන්පත් කිරීම.

B. මිසරය සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වීම.

C. අම්බුලුගල කුමරු යවා උඩරට කැරැල්ල මර්දනය කිරීම.

(ii) පහත උපකාරක පද උදවු කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට

(1) දඹදෙනි රාජධානියේ දෙවන පැරකුම් රජු විසින් රචිත කෘතියකි.

(2) දඹදෙනි යුගයේ ලංකාව ආක්‍රමණය කළ ජාවක රජෙකි.

(3) කෝට්ටේ යුගයේ රචිත කාව්‍ය විශේෂයකි.

(4) අලකේශ්වර පරපුර යටතේ පැවැති රාජධානියකි.

පහළට

(5) කුරුණෑගල යුගයේ රචිත කෘතියකි.

(6) යාපන රාජධානිය ගැන තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රයකි.

(7) යාපනයේ රාජ්‍ය කළ රජ පෙළපත මේ නමින් හඳුන්වයි.

(8) ගම්පොළ යුගයේ ගොඩනැගූ බෞද්ධ සිද්ධස්ථානයකි.

(ලකුණු 8)

(06) (i) ග්‍රීක පෞර රාජ්‍යවල කැපී පෙනෙන ලක්ෂණ 03ක් නම් කරන්න. (ලකුණු 3)



(ii) (අ) මෙම පින්තූරයේ දැක්වෙන දේවස්ථානය කුමක්ද? (ලකුණු 1)

(ආ) මෙම දේවස්ථානය ඉදි කළේ කුමන දෙවඟන සඳහා ද? (ලකුණු 1)

(ඇ) දේවස්ථානය ගොඩනැඟීමට ග්‍රීකයන් භාවිත කළ ද්‍රව්‍ය 02ක් නම් කරන්න. (ලකුණු 2)

(iii) පහත දැක්වෙන්නේ ග්‍රීක ශිෂ්ටාචාරයේ බිහි වූ ශ්‍රේෂ්ඨයන් කීප දෙනෙකි. ඔවුන් වැදගත් වූයේ කුමන ක්ෂේත්‍රවලින් දැයි දී ඇති තොරතුරුවලින් තෝරා ලියන්න.

A - හෙරඩෝටස්

B - හිපොක්‍රටිස්


C - ආකිමිඩීස්

D - සොක්‍රටීස් (ලකුණු 4)

(බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා, ගණිතඥයෙකු හා විද්‍යාඥයෙකු, ග්‍රීක දාර්ශනිකයෙකි, ඉතිහාසඥයෙකි.)

(07) (i) රෝමය සමග වෙළෙඳ සම්බන්ධතා පැවැත් වූ ආසියාතික රටවල් 03ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) (A) පින්තූරයේ දැක්වෙන්නේ රෝමය පාලනය කළ පළමු අධිරාජ්‍යයා ය. ඔහු කවු ද? (ලකුණු 1)



(B) ඔහුගේ කාලයේ සිදු වූ වැදගත් ඓතිහාසික සිදුවීම කුමක් ද? (ලකුණු 1)

(C) මෙතුමන්ගේ කාලයේ ඉදි වූ රෝමයේ පැරණි ස්මාරක 02ක් නම් කරන්න. (ලකුණු 2)

(iii) පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ රෝමවරුන් කළ නිර්මාණ 04ක් දක්වන්න.

(A) උසස් පද්‍ය කෘතියකි.

(B) විශිෂ්ඨ මූර්තියකි.

(C) එළිමහන් රංග පීඨයකි.

(D) ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨත්වය පිළිබිඹු කරන දේවස්ථානකි. (ලකුණු 4)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

## ඉතිහාසය පිළිතුරු පත්‍රය

### I කොටස

(01) ලියැදි
(02) පල්ලව
(03) පකිස්ථානය
(04) දේව පතිරාජ
(05) ඇතැන්ස්
(06) 3
(07) x
(08) 3
(09) x
(10) 3
(11) 4
(12) 2
(13) 2
(14) 3
(15) 2
(16) ස්වර්ණකාර, තුලාධර
(17) අඹගමුව
(18) වෙස් මුහුණු
(19) කුරුණෑගල
(20) රොමියුලස්

(ලකුණු 20 x 2 = 40)

### II කොටස

(01) (i) අනුරාධපුරය (ii) C (iii) ආදියාතික්
(iv) B (v) කෑරගල පද්මාවතී පිරිවෙන (vi) කෝට්ටේ
(vii) ඇතීනා දෙවඟනගේ (viii) රන් හා ඇත්දත්
(ලකුණු 2 x 8 = 16)

(02) (i) * දඬු වැට දැමීම * ගිනිමැල ගැසීම * පැල් රැකීම (ලකුණු 3)
(ii) A. හේන් ගොවිතැන B. කුඹුරු ගොවිතැන
C. සත්ත්ව පාලනය D. වෙළඳාම (ලකුණු 4)
(iii) 1. විනය හා ශික්ෂණය 2. අන්‍යොන්‍ය සහයෝගය
3. මංපෙත් සෑදීම 4. දාගැබ් ඉදි කිරීම, වැව් අමුණු සෑදීම. (ලකුණු 4)

(03) (i) මානවම්ම රජු, පළමු වන සේන රජු, දෙවන සේන රජු (ලකුණු 3)
(ii) A - අනාගත රජකම ලබන තැන්ත්තා
B - ලේඛන කටයුතු භාර ප්‍රධානියා
C - රට යනුවෙන් හැඳින් වූ ප්‍රාදේශීය පාලන ඒකකය පාලනය කළ අය
D - අනුරාධපුර යුගයේ මුල් කාලයේ දී ගම පාලනය කිරීම භාර වූ අය (ලකුණු 4)
(iii) A - බුද්ධදාස රජතුමා B - I වන උපතිස්ස රජු
C - I වන උදය රජු D - 4 වන කස්සප රජු (ලකුණු 4)

(04) (i) A - පල්ලව B - පාණ්ඩ්‍ය C - චෝළ (ලකුණු 3)
(ii) H, F, G,E, C, D, B, A (ලකුණු 8)

(05) (i) A - 3 වන විජය බාහු රජු B - I වන බුවනෙකබාහු රජු C - VI වන පැරකුම් රජු (ලකුණු 3)

(ii) හරහට

1. කව්සිළුමිණ 2. චන්ද්‍රභානු

3. සංදේශ කාව්‍ය 4. රයිගම

පහළට

5. සිංහල බෝධිවංශය 6. ශෛගරාසසේකර මාලෙයි

7. ආර්‍ය චක්‍රවර්තී 8. ගඩොලාදෙණිය (ලකුණු 8)

(06) (i) * භූමි ප්‍රදේශය කුඩා වීම

* ජනගහණය සිමිත වීම

* පුරවැසියන්ට පමණක් දේශපාලන අයිතිවාසිකම් ලැබීම. (ලකුණු 3)

(ii) (අ) පාතිනන් දේවස්ථානය (ලකුණු 1)

(ආ) ඇතීනා දෙවඟන (ලකුණු 1)

(ඇ) හුනුගල්, කිරිගරුඬ, වර්ණවත් පිඟන් ගඩොල් (ලකුණු 2)

(iii) A - ඉතිහාසඥයෙකි. B - බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා

C - උසස් ගණිතඥයෙකු හා විද්‍යාඥයෙකි D - ග්‍රීක දාර්ශනිකයෙකි. (ලකුණු 4)

(07) (i) ඉන්දියාව, චීනය, ලංකාව (ලකුණු 3)

(ii) (A) ඕගස්ටස් සීසර් (ලකුණු 1)

(B) ජෙරුසෙලම අසල බෙත්ලෙහෙමේ දී ජේසුතුමාගේ උප්පත්තිය සිදුවීම. (ලකුණු 1)

(C) කොලෝසියම් ගොඩනැගිල්ල

කැරකැල්ලා මහා නානතටාකය (ලකුණු 2)

(iii) A - වර්ජිල් කවියාගේ ඊනිඩ්

B - නීරෝ අධිරාජයාගේ ලෝකඩ හිස

C - කොලෝසියම් ක්‍රීඩා පිටිය

D - පැන්තියන් දේවස්ථානය (ලකුණු 4)